අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/9/15/06/01/12 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2023.06. 21

විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
කොළඹ.

**"BIUE & GOID" කුසලාන අන්තර් පාසල් සත් සාමාජික හොකී තරගාවලිය - 2023**

උක්ත කරුණ සම්බන්ධ ඔබගේ දින රහිත ලිපිය හා බැඳේ.

02. ඔබ පාසල මගින් 2023 අගෝස්තු 12 , 13 දිනයන් හි රාජකීය විද්‍යාලයීය ක්‍රීඩාංගනයේ දී පැවැත්වීමට සැලසුම් කර ඇති "BIUE & GOID" කුසලාන අන්තර් පාසල් සත් සාමාජික හොකී තරගාවලිය - 2023 සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව පාසල් සිසුන් සහභාගී කර ගැනීම සඳහා අනුමැතිය ලබා දෙමි.

1) තරගාවලියට සහභාගී වීම වෙනුවෙන් පාසල් ක්‍රීඩක / ක්‍රීඩිකාවන්ගෙන් මුදල් අය කර නොගත යුතුය.
2) මෙම තරගාවලිය පිළිබඳව පාසල් දැනුවත් කිරීම හා තරගාවලිය සඳහා සිසුන් කැඳවීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබූ මෙම ලිපිය ද ඉදිරිපත් කළ යුතුය.
3) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති Covid-19 ව්‍යාප්තිය වැලැක්වීමේ මාර්ගෝපදේශවලට අනුකූලව ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් සහභාගී කර ගත යුතුය.
4) ගුරුභවතුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ හා දෙමාපියන්ගේ ලිඛිත අවසරය මත ශිෂ්‍ය / ශිෂ්‍යාවන් තරගාවලිය සඳහා සහභාගී කර ගත යුතුය.
5) තරගාවලියට සහභාගීවන ශිෂ්‍ය / ශිෂ්‍යාවන්ට පූර්ණ ආරක්ෂාව සැලසීම සඳහා තරගය පවත්නා දිනයන් හි සුදුසුකම්ලත් වෛද්‍යවරයකු , ගිලන්රථ සහ නියමිත වෛද්‍ය කාර්යමණ්ඩලය මුළු තරග කාලය තුළදීම සිටින බවට වග බලා ගත යුතුය.
6) ජාතික මට්ටමේ විභාගවලට බාධාවක් නොවන ලෙස තරග දින යොදා ගත යුතුය.
7) රටෙහි පවත්නා වත්මන් තත්වය අනුව රජය/අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරනු ලබන නියෝග/උපදෙස් පිළිපැදිය යුතුය.
8) මත්පැන්, මත්ද්‍රව්‍ය සහ දුම්කොළ සමාගම් මගින් අනුග්‍රාහකත්වය ලබා නොගත යුතු අතර ඒ සම්බන්ධ දැන්වීම් ප්‍රචාරණය කිරීම තහනම් බව දක්වමි.

(signature)

වී.උපාලි අමරතුංග
අධ්‍යාපනඅධ්‍යක්ෂ (රාජකාරී ආවරණ )
ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා

අත්.කළේ: ගයාත්‍රි අබේගුණසේකර
අතිරේක ලේකම්
අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන,
අධ්‍යාපන ලේකම් වෙනුවට

පිටපත් -

1. සියලුම පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස
2. ලේකම්, ශ්‍රී ලංකා පාසල් හොකී සංගමය - කරු.අ.ක.ස /දැ.ගැ.ස